
## ඉස්කෝල හන්දිය

**මොහාන් ලාල් ග්‍රේරු**



# අනගාරික ධර්මපාලතුමා සහ අමද්‍යප ව්‍යාපාරය

මෙහි මා උපුටා දක්වන්නේ, අප ජාතික ව්‍යාපාරයේ නායකයකු වූ එල්.එච්. මෙත්තානන්ද මහතා 1955 වසරේදී මෙරටේ මත්පැන් ව්‍යසනය පිළිබඳ අනගාරික ධර්මපාලතුමාගේ චින්තනය පැහැදිලි කරමින් ලියූ ලිපියකි.

සියලුම පුද්ගලික බලාපොරොත්තු තම සිතින් තුරන් කොට හුදෙක් ලංකා ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තම ජීවිතය කැප කළ අනගාරික ධර්මපාලතුමා (පසුව සිරි දේවමිත්ත ස්වාමීන් වහන්සේ) වරක් ලංකා තරුණයන් අමතා මෙසේ ප්‍රකාශ කළේය.

"ඉංග්‍රීසි ආණ්ඩුව අප රට අවුරුදු සියයක් පාලනය කළායින් පසු සිංහලයින් තුළ පැවැති ජාතික සමගිය නැති වී ගෙන යයි. අවුරුද්දක් පාසා ඔවුන් අතර අපරාධ වැඩි වී ගෙන යයි. ඔවුන්ගේ අඥානකම අතිශයින් භයංකරය. ඔවුන්ගේ දේශීය කර්මාන්ත අතුරුදහන් වෙයි. සිංහල ගොවියාට නිරාහාරව ජීවත්වන්නට සිදු වෙයි. ගවයෝ ඔවුන්ගේ කෑම උලාකන්ට තැනක් නැතිව මැරීගෙන යති. තණබිම් හා ගම්බද කැලෑ සිංහල ගොවියාගෙන් කෲර ලෙස උදුරා ගනිමින් ආණ්ඩුව ඒවා යුරෝපීයන්ට රබර් හා තේ වවන්ට විකුණයි. ආණ්ඩුව දහස් ගණන් තැබෑරුම් ගම්මානවල පිහිටුවා මුළු මහත් ජනතාවගේ විරෝධයට කිසිසේත් කන් නොදී දුප්පත් ගැමියාට මත්පැන් පානය කරන්නට බල කරයි. ක්‍රි.ව. 1801දී අසාධාරණ ලෙස මුදල් ගැරීමට පළමුවරට මත්පැන් තැබෑරුම් පිහිටෙව්වේ ඉංග්‍රීසි ආණ්ඩුව විසිනි."

ඉංග්‍රීසි ආණ්ඩුව විසින් මැත්පන් තැබෑරුම් සංඛ්‍යාව වැඩි කිරීම පිළිබඳව අනගාරික ධර්මපාලතුමා මෙසේද කියා තිබේ.

"ලංකාවේ සුරා ශාලා සංඛ්‍යාව වැඩි කිරීමට ඉංග්‍රීසි මහ නිළමේ තීන්දුව දී තිබේ. ශක්‍ර පුරයෙන් අසුරයන් පන්නා දැමුවේ ඔවුන්ට සුරා බොන්ට දීලා බව පොතින් පෙනේ. සිංහලයා නැති කිරීමට සුද්දා මාර්ග දෙකක් තනා තිබේ. එකක් සුරාවයි. අනික සිංහල දරුවා ක්‍රිස්තියානි කිරීමයි. මේ මාර්ග දෙකෙන් සිංහල ජා තිය නැති කළ හැකිය. සිංහලයිනි, වහාම අඥානකම නැතිකර දමා නුවණින් ක්‍රියා කරව්."

සිංහලයා තමන්ගේ ගම්බිම්වලින් නෙරපා දමා මරා දැමීමට ඉංග්‍රීසි ආණ්ඩුව යෙදූ මාර්ග දෙකෙන් එක මාර්ගයක් සුරාව බව අනගාරික ධර්මපාලතුමා මේ ලිපිවලින් අනාවරණය කරයි. මෙය චීන මිනිහා මරා දැමීමට අබිං යොදා ගත්තාක් මෙනි. අප්‍රිකාවේ නීග්‍රෝ ජාතිකයන් වැනසීමට රම් වැනි මත්පැන් යොදා ගත්තාක් මෙනි.

විදේශ ආක්‍රමණයට පෙර සිංහලයා මද්‍ය පානයෙන් වෙන් වී සිටි ජාතියක් බව සනාථ කිරීමට බොහෝ සාක්ෂි ඇත. 1734 සිට 1737 දක්වා ලංකාවේ පදිංචිව සිටි ජර්මන් ජාතික හයිඩ්ට් මහතා සිංහලයා ගැන මෙසේ කියා තිබේ. "ඔවුන් අතරේ පෙනෙන්නට තිබෙන ඉතා උත්කෘෂ්ට දෙයක් නම් ඔවුන් බේබදුකම අතිශයින් පිළිකුල් කරන බව ය. ඔවුන් අතරේ ඉතාම පහත් අය හැර මත්පැන් පානය කරන්නවුන් පෙනෙන්නේ කලාතුරකිනි. සාමාන්‍ය වශයෙන් ඔවුහු බොහෝ ශාන්ත දාන්ත වෙති." ඉතිහාසඥ පෝල් ඊ. පීරිස් මහතා ප්‍රතිකාල්වරුන් ගැන ලියූ පොතෙහි මෙරට රා මෙන් අරක්කු පෙරන්ට පළමුවෙන් පටන් ගත්තේ ප්‍රතිකාල්වරුන් විසිනැයි පෙන්වා දී තිබේ.

ඉක්බිති අරක්කු පෙරීම ලන්දේසීන් විසින් පවත්වාගෙන යන ලදී. නොඅනුමානව, සෙසු සුදු මිනිසුන් ද සාමාන්‍ය වශයෙන් එක හා සමාන යයි වටහාගත් සිංහලයන් සුදු මිනිහාට මත්පැන්, බිළිඳාට කිරි හා සමාන යයි කල්පනා කළ බව නොක්ස් මහතා කියයි.

ඉතින්, ප්‍රතිකාල්වරුන්ගේ හා ලන්දේසීන්ගේ මත්පැන් පානය කිරීමේ චාරිත්‍රය සිංහලේට ගලා ඒම වැළැක්වීම සඳහා සිංහල රජවරු දැඩි නීති පැනවූ හ. "සිංහලේ හා ජාති හිතෛෂියෝ" නමැති පොතෙහි සඳහන් වන්නේ "ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා තමන්ගේ රටවැසියන් අතර මත්පැන් පාවිච්චියට විරුද්ධව තදින් ක්‍රියා කළේය. රටේ මත්පැන් පෙරීම සහමුලින්ම තහනම් කළේය" යනුයි.

1815දී සිංහලේ, ඉංග්‍රීසින් විසින් අල්ලා ගත් විට මහනුවරට පැමිණි ඉංග්‍රීසි සෙබළුන්ට බොන්ට අරක්කු නැති විය. සිංහලේ කිසිම තැනක අරක්කු සොයා ගන්ට නොතිබුණේය. එමනිසා කළුතර දිස්ත්‍රික්කයෙන් සෙබළුනට අරක්කු ගෙන්වා ගන්ට සිදුවිය. ඉක්බිති රා මදින්නන් කොළඹින් ගෙනවුත් මහනුවර රාජෝද්‍යානයක අරක්කු පෙරන්ට පටන් ගත්හ.

සිංහලයන් අතර මත්පැන් පානය පැතිරෙවූ හැටි තෝමස් ස්කිනර් මහතා ස්වකීය "ලංකාවේ අවුරුදු පනහක්" නමැති පොතේ විස්තර කරයි. "රේන්දකාරයෝ දිස්ත්‍රික්කයක් තුළ තැබෑරුම් පිහිටුවීමේ තනි බලය ආණ්ඩුවෙන් මිලට ගත්හ. සෑම දිස්ත්‍රික්කයකම සෑම ගමක පාහේ බොහෝ විට ඒවායේ පදිංචි ගැමියන්ට හිරිහැර කර මුලාදෑනියාගේ විරුද්ධත්වය නොසලකා තැබෑරුම් පිහිටුවති. ගැමියන්ට අරක්කුවල රස බලන්න නොයෙක් විට නොමිලේ අරක්කු බෙදා දෙන්ට සිදුවේ. මත්පැන් පානය කරන්ට පටන් ගත් විට එය සීමාව ඉක්මවා බොන බව නිසැකවම දන්නා නිසා තැබෑරුම්කාරයෝ මෙසේ කරති. අවුරුදු කීපයකට පෙර සියයකට එක් කෙනෙක්වත් මත්පැන් පානය කරන්ට පොළඹවාගන්ට බැරි වූහ. දැනට නම් බේබදුකම කොපමණ පවතින්නේද කිවහොත් අරක්කු ලබා ගැනීම පිණිස කුඹුරුවල අස්වැන්න පවා තැබෑරුම්කාරයින්ට උකස් කර තිබෙන පෙදෙස් මම දනිමි." ස්කිනර් මහතා මෙසේද කියයි. "කාරුණික රජයක යුතුකම හැටියට සැළකියයුත්තේ එක්කෝ ගම්මානවල තැබෑරුම්වල සංඛ්‍යාව සීමා කිරීමය. නැත්නම් යටත් පිරිසෙයින් රටවැසියන්ගේ විරෝධය සලකා බලා ඒවා බලෙන් පිහිටුවන්ට ඉඩ නොදීම ය" යනුයි.

එක් අතකින් ඉංග්‍රීසි ආණ්ඩුව සිංහලයන්ට බලෙන් මත්පැන් පානය පුරුදු කරවීමත් අනික් අතින් සිංහලයන්ගේ ගම්බිම්, කර්මාන්ත, කුඹුරු, ගවයින් නැති වීමත් එකරවම සිදු විය. මේ අන්තරා එදාමෙන් අද ද පවතී. මේ අන්තරාවලින් සිංහල ජනතාව ගලවා ගන්ට පුළුවන් වන්නේ ස්වරාජ්‍යයට ඇති ප්‍රේමය මගිනි.

අනගාරික ධර්මපාලතුමා ස්වරාජ්‍යයට ඇති ප්‍රේමය ගැන "අපේ සිංහල ජනතාව දිනෙන් දිනම පිරිහීමට යෑම" නමැති ලිපියෙහි මෙසේ පවසයි. "සිංහල ජනතාව එක් අතකින් යුරෝපීයයන්ගේ චාරිත්‍ර ගැනීමත්, අනික් අතින් මත්පැන් පානය කිරීමත් නිසා ස්වරාජ්‍යයට ඇති ප්‍රේමය නැති වී තිබේ."

අද ද දේශානුරාගය නැති වී යාමට හේතුව මෙයයි. මද්‍යපානය වර්තමාන පරිහානියේ මුල ය. මින්පසු කී නොකී දූෂණවලට මග පෑදෙයි. එකී දූෂණවලට ඇබ්බැහි වූ තැනැත්තාට දූ දරුවන් අමතක වෙයි. ලැබෙන වැටුපත් මදිය. මුදල් ඇති තැනකින් සොරා ගැනීමට හෝ කිසිදු පැකිලීමක් ඇති නොවේ. බොහෝ විට අල්ලස් දීම හා ගැනීම්, හොරකම්, හොරවැඩ, තක්කඩිකම්, දේශද්‍රෝහී ක්‍රියා, ජාති විරෝධී ක්‍රියා මත්පැන් පානයෙන් මතු කරන අපරාධ වෙති. ඒ අපරාධකාරයින්ට මොන දේශානුරාගයක්ද? අනගාරික ධර්මපාලතුමා අපට කියා තිබෙන්නේ, "ස්වකීය පුද්ගලික ප්‍රයෝජනයට අපව දුසිරිතෙහි යොදවන සුදු මිනිසාගේ චාරිත්‍ර අප අන්ධානුකරණය කරන බවයි." එතුමා මෙසේද කියයි.

"ඔබ වැනසීම පිණිස ඔබගේ රටේම ඔබට මත්පැන් නමැති වහ බොන්ට දෙන ප්‍රබල හතුරු සේනාවක් ඔබ වටකර ගෙන සිටිනවා යැයි සිතා ගන්න. සුජාත විද්‍යාව දන්නා විද්‍යාඥයෝ මද්‍යසාරය ජීව බලයේ බීජාංකුරයට විස වද්දවන බව උගන්වයි. මත්පැන් පානය කරන පියා තම දරුවාගේ, තම පරපුරේ හතුරෙකි".

ලංකාවේ සිංහල ජනතාව නැති කර දැමීමට සැරසී සිටින යක්ෂයෝ නමැති ලිපියෙහි අනගාරික ධර්මපාලතුමා මෙසේ කියයි.

"විස්කි, බ්‍රැන්ඩි, අරක්කු බීමට සහ සත්ව ඝාතනය කරන්ට උගන්වන්නේ මිත්‍යා දෘෂ්ටික ගුරුවරුය. මේ යක්ෂයින්ට අසු නොවන්ට බෞද්ධ සිංහල ජනතාව වීර්යය කළ යුතුයි."

**එල්.එච්. මෙත්තානන්ද**

(උපුටා ගැනීම: (සංස්) කමලාදේවි එදිරිවීර "මෙත්තානන්ද ලිපි" (පිටු 167-170)